**ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 260 - නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව** | **ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය** | **මෙම වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|
| 1.6. (අ) | ආදායම හා වියදම ගිණුම්ගත කල යුතුය | 1.6 (අ) |
| 1.6. (ඈ) | නොපියවූ අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරිමට කටයුතු කල යුතුය | 2.1 |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සූර්ය විදුලි බල පද්ධතියෙන් සමාලෝචිත වර්ෂයේ ජාතික පද්ධතියට විදුලිය ඒකක 4603 ක් ලබාදී තිබුණු අතර, පරිභෝජනය කල ඒකක ප්‍රමාණය 8443 ක් විය.විදුලිය වියදම් ගිණුම් ගත කිරීමේදී පරිභෝජනය කල ප්‍රමාණය නිෂ්පාදනය කළ ප්‍රමාණයට හිලව් කර රු.196,119 ක බිල්පත් පියවීම හේතුවෙන් විදුලි ඒකක 4603 ට අදාල මුළු ආදායම හා ඒකක 8443 ට අදාළ මුළු වියදම ගිණුම් ගත කිරීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි. | පරිභෝජනය කල ඒකක ප්‍රමාණය නිශ්පාදනය කල ඒකක ප්‍රමාණයට හිලව් කර වෙනස පමණක් ගිණුම්ගත කරන බැවින්, අදාල ආදායම හා වියදම වෙන වෙනම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරිමට නොහැකි වි ඇති බව. | ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම දැක්විය යුතු වේ. |

**(ආ) අවසාන තොගය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ,සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 හි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයේ එකතුව රු.14,464,074 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ආකෘතියට අනුව අවසන් තොගය ගිණුම්ගත කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව. | වත්කම් ගිණුම් ගත කල යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**2.1 අග්‍රිම ගිණුමේ ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පිළියෙල කල මූල්‍ය ප්‍රකාශනයේ අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA-3) දක්වා තිබුණු, 2013 වර්ෂයේ සිට පැවත එන රු 900,878.ක අග්‍රිම ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | නොපියවූ අත්තිකරම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය XXIV පරිච්ඡේදයේ 4.4 ඡේදය අනුව මිය ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු. 334,470 ක ණය මුදල් අවුරුදු 01 ත් 03 ත් අතර කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | නිලධාරින් දෙදෙනාගේ විශ්‍රාම වැටුප් ලිපිගොනු සකස් කරමින් පවතින බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හල්ගොල්ල ග්‍රාම සේවා වසමේ අවදානම් තත්ත්වයක් හේතුවෙන් පදිංචිය ඉවත්කර ආපදා සහන සේවා ඒකකය විසින් රු.1,200,000 ක මුදලක් ලබාදී නව නිවසක් ඉදිකර එහි පුද්ගලයෙකු පදිංචි කරවා තිබුණද අවදානම් කලාපයේ පිහිටි පැරණි නිවස කඩා ඉවත් නොකිරීම හේතුවෙන් අදාල පදිංචිකරු නිවාස දෙකම පරිහරණය කරන බවක් නිරීක්ෂණය විය. | ආපදා තත්ත්වය හේතුවෙන් පදිංචියෙන් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති නිවසින් ඉවත් වන ලෙසට ප්‍රතිලාභියා දැනුවත් කර ඇති බව. | අවදානම් ලෙස හඳුනාගත් පවුල් සඳහා නව නිවාස ලබාදීමේදි අවදානම් ස්ථානයෙන් ස්ථිර වශයෙන්ම ඉවත් කිරීමට කටයුතු කල යුතුය. |

**2.4 වංචනික ස්වරූපයේ ගනදෙනු**

පහත සඳහන් නිරික්ෂනයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක ඉන්ධන ටැංකියේ උපරිම ධාරිතාවය ලීටර් 80 ක් වුවද, එම ප්‍රමාණය ඉක්මවා අවස්ථා 72 දී ඉන්ධන ලීටර් 7,958 ක් ලබාගෙන තිබුණි. 2023 නොවැම්බර් 14 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාව අනුව, වාහනයේ ටැංකියේ ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 10 ක් වුවද, එදිනට ධාවන සටහන අනුව ටැංකියේ ඉතිරිව තිබෙන ඉන්ධන ප්‍රමාණය ලීටර් 298.54 වූයෙන් ඉන්ධන ලීටර් 288.54 ක් වෙනුවෙන් රු.101,313 ක (අවසන් වරට ඉන්ධන ලබාගත් මිල පදනම කරගෙන) අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මූලික පරික්ෂණයක් සඳහා කටයුතු සිදුකරමින් පවතින බව. | නිසි අධීක්ෂණය හා පාලනයක් පවත්වා ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 31දෙනෙකු සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට 2024 ජනවාරි දක්වා කාලය තුල ඉරිදා දිනවලදී නිවාඩු දින රාජකාරි ඉටු කිරීමේදී ඇඟිළි සළකුණු යන්ත්‍රය භාවිතාකර නොතිබියදී රු.227,425 ක් නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මක නොවන අවස්ථාවන්හීදී පමණක් පැමිණීමේ ලේඛනය පදනම් කර ගනිමින් ගෙවීම් කටයුතු සිදුකරනු ලබන බවත්, ඒ අනුව 2023 ජනවාරි මස සිට 2024 ජනවාරි මස දක්වා කාලය තුල ඉරිදා දින නිවාඩු දින වැටුප් ලබාගැනීමේදී පැමිණීමේ ලේඛනය අනුව ගෙවීම් කරනු ලැබූ අතර, ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් සලකුණු ලබා ගැනීමේ හැකියාව නොපැවතීම හැරුණු කොට යන්ත්‍රය ක්‍රියා විරහිත කිරීමක් සිදුකර නොමැති බව. | අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී නිලධාරින්ගේ පැමිණීම හා පිටවීම සනාථ කරගත යුතු වේ. |
| (ඇ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි බැංකු මඟින් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට ජුනි මස දක්වා කාලය තුල මිය ගිය ප්‍රතිලාභින් 7 දෙනෙකු සඳහා වැඩිහිටි දීමනා වෙනුවෙන් රු.66,500 ක් පෞද්ගලික ගිණුම්වලට බැර කර තිබුණි. | ප්‍රතිලාභින් විසින් නම්කර තිබුණු නියෝජිතයින් විසින් මුදල් ලබාගෙන ඇති බව හා එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | වැඩිහිටි දීමනා ලබාගන්නා ප්‍රතිලාභියකු මිය ගිය විට ග්‍රාම නිලධාරි විසින් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ගෙවීම් නතර කිරීමට කටයුතු කල යුතු වේ. |

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 570 (අ) ප්‍රකාරව ඉඩම් ඉල්ලීම් සඳහා තැන්පතු, තැන්පත් කල දින සිට වර්ෂ 10 ක් ඉක්මවූ විට මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතු වුවත්. 2011 වර්ෂයේ සිට 2013 අතර කාලය තුල අවස්ථා 07 කදී තැන්පත් කරන ලද රු.876,799 ක තැන්පතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | අදාල ආයතන වෙතින් විස්තර ඉල්ලා ඇති බවත්, පිළිතුරු ලද වහාම ඉදිරි කටයුතු සිදුකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් ගැටතුළාව රජයේ නිවාසය අළුත් වැඩියා කිරිම යටතේ එම නිළ නිවාසයේ අභ්‍යන්තර නාන කාමරයක් ඉදිකිරිම වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී රු.382,101 ක් වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් ඒ සඳහා ජල සැපයුම ලබා දිම සිදුකර නොතිබුණු බැවින් නාන කාමරය භාවිතයට ගැනීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණු අතර , ඉදිකර තිබුණු නාන කාමරය වෙත දීර්ඝ කාලයක සිට බාහිරින් මඩ සහ ජලය එකතුවි තිබුණි. | ජල සැපයුම සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ආරම්භයේ දීම ඉල්ලීම් කර ඇති අතර සම්බන්ධතාවයන් මෙතෙක් ලබාදී නොමැති බව | අලුත්වැඩියා සම්පූර්ණ කර ජල සම්බන්ධතා ලබාදී උපයෝජනය කල යුතුය. |
| (ආ) | නාය යෑමේ අධි අවදානම් කලාපයක් ලෙස 2017 වර්ෂයේ හඳුනාගෙන තිබුණු අඹගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් හැටන්, සමනළගම ස්ථානයේ පවුල් 12 ක් එම ස්ථානයෙන් ඉවත් කිරීමට තීරණය කර ඉන් පවුල් 06 ක් සඳහා රජයේ ඉඩමක නිවාස ඉදිකිරීමට රු.6,300,000 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි.සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 06ක් ගතවි ඇතත්. ඉදිකිරිම් කටයුතු අවසන් නොකර අතර මඟ නවතා තිබුණි . | ඉවත් කිරිමට යෝජිත පවුල් සමඟ සාකච්ඡා කොට අවදානම් ස්ථානයෙන් ඉවත් කිරීම සහ ඉදිකරන නව නිවසේ පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව. | අදාල ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කර පදිංචි කිරීමේ කටයුතු අවසන් කල යුතුය. |
| (ඇ) | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දොඩම්කුඹුර ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය සුරක්ෂිත මධ්‍යස්ථානයක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා 2020 අගෝස්තු 31 දින රු.940,500 ක් හඟුරන්කෙත ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වැයකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාල ගොඩනැගිල්ල කිසිඳු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අඩුපාඩු නිවැරදි කර ගනිමින් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජය ලබාදෙන රුපියල් ලක්ෂ 04ක මුදලින් ප්‍රතිලාභියා විසින් මිලදී ගන්නා ඉඩමක රජය විසින් ලබාදෙන මූලාධාර මත නිවාසයක් ඉදිකිරීමේ අවස්ථාව යටතේ ,ආපදා සහන සේවා ඒකකය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක අවදානම් ලෙස හඳුනාගත් පවුල් 159 ක් සඳහා නිවාස ඉදිකර නැවත පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද ,ඉන් පවුල් 115 ක් එසේනැවත පදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම රජය විසින් ලබාදෙනු ලබන ඉඩමක රජයේ මූලාධාර වලින් නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ, ආපදා සහන සේවා ඒකකය විසින් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පවුල් 970 ක් වර්තමාන පදිංචි ස්ථානයෙන් ඉවත් කර ආරක්ෂිත ස්ථානයන්හි පදිංචි කිරීමට සැලසුම් කර තිබුණද , ඉන් පවුල් 798 ක් ආරක්ෂිත ස්ථානයන්හි ස්ථාන ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ආපදා අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාල තොරතුරු යොමු කර ඇති බව. | අවදානම් ප්‍රදේශවලින් පදිංචි කරුවන් ඉවත් කර නැවත පදිංචි කිරීම කඩිනම් කල යුතුය |
| (ආ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාය යෑම් හා අධි අවදානම් තත්ත්වයන් හේතුවෙන් 2019 වර්ෂයේ ඉවත් කරනු ලැබූ පවුල් 04 කට කළුගල මිල්ලගහමුල ප්‍රදේශයේ ඔවුන් විසින් මිලදී ගත් ඉඩමක නිවාස ඉදිකිරීම සහ ඉඩම මිලදී ගැනීම සඳහා රු.,2,700,000 ක් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් මූලික අදියරේ පැවති අතර, ප්‍රගතිය සියයට 30ක පමණ පහල මට්ටමක පැවතුණි. | ඉදිකිරීම්වල ප්‍රගතිය අනුව වාරික නිදහස් කිරීම තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ සිදුකරන බව. | අවදානම් ප්‍රදේශවලින් පදිංචි කරුවන් ඉවත් කර නැවත පදිංචි කිරීම කඩිනම් කල යුතුය |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාතිය යටතේ 2018 වර්ෂයේදී හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.6,900,000 ක් වැයකර බීජ බෝංචි ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් හා ශීතාගාරයක් ඉදිකර | වර්තමාන බීජ බෝංචි මිල හමුවේ ප්‍රතිමිලදී ගැනීමක් සිදු කිරීමට අවශ්‍ය නොවූ බවත්, අනාගතයේදී බීජ බෝංචි මිල අස්ථාවර වුවහොත් එවන් අවස්ථාවක අවම වශයෙන් | ව්‍යාපෘති අරමුණු ඉටුවන ආකාරයට ව්‍යාපාති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම කල යුතුය. |

| | |
|---|---|
| තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අරමුණුගත කාර්යයට යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | බීජ බෝංචි කිලෝ 10000 ක් මිලදී ගැනීමට කටයුතු කරන බව. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රු 4,383,929.ක ලොරි බවුසරය වසර 02ක පමණ කාලයක සිට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් වටිනාකම හඳුනාගත නොහැකි වත්කම් ඒකක 93 ක් වසර 01 සිට වසර 05 අතර කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | මේ සම්බන්ධයෙන් සුදුසු කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 මාර්තු 23 දින විශ්‍රාම ලබා 2020 මැයි 30 දින මිය ගොස් ඇති ප්‍රතිලාභියෙකුගේ වැන්දඹු අනත්දරු ,විශ්‍රාම වැටුප වසර 03 ක් ගතවී තිබුණද, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සකස් කර නොතිබුණි. | මිය ගිය පුද්ගලයාගේ ලිපිගොනු සොයා ගැනිමට නොහැකි වූ බවත්, කලත්‍රයාද 2023 දෙසැම්බර් 06 දින මිය ගොස් ඇති බව. | නියමිත කාලය තුල ගොනු සකස්කර විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 1981 අංක 58 දරන සහ 1983 අංක 29 දරන පනත්වලින් සංශෝධිත 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනීමේ පනත අනුව බ්ලැක්පූල් ස්ථානයේ අනවසර පදිංචිකරුවන් ඉවත් කර අදාල ඉඩමේ සන්තකය පවරා ගැනීමට නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වූ අංක 76818 දරන නඩුවට අදාලව 2006 නොවැම්බර් 28 දින ලබාදී තිබුණු තීන්දුව හා 2010 ඔක්තෝබර් 01 දින නුවරඑළිය මහාධිකරණය විසින් ලබාදී තිබුණු තීන්දුව අනුව, සන්තකය පවරා ගැනීමට 2024 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාල නඩු නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් 2024 පෙබරවාරි 19 දින ලබාදී ඇති බැවින්, ඒ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | නඩු තීන්දුවේ නියෝගය ක්‍රියාත්මක කර සන්තකය පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියෙකු නිවාඩු දැනුම් දීමකින් තොරව දින 27ක් සේවයට වාර්ථා කර නොතිබුණි. එසේම ආයතන ප්‍රධානියා හෝ අධීක්ෂණ නිලධාරියා දැනුවත් කිරීමකින් තොරව මහජන දිනය තුල රාජකාරියට වාර්තා නොකිරීම, ක්ෂේත්‍ර රාජකාරි සඳහා කල වැඩසටහන් හා ඉදිරි වැඩසටහන් ඉදිරිපත් නොකිරීම ,දීර්ඝ කාලයක සිට සිදුකරමින් තිබියදි, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දින වන විටත් අධීක්ෂණ නිලධාරීන් විසින් කිසිදු විධිමත් පරීක්ෂණයක් සිදුකර විනය ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු 581,160.ක වැටුප් ගෙවා තිබුණි. | සමස්ථයක් වශයෙන් මෙම නිලධාරියාගේ රාජකාරි පිළිබඳව අධීක්ෂණයේදී සිදු වූ ප්‍රමාදයන් පිළිගන්නා අතර, මින් ඉදිරියට මෙවැනි කටයුතු සිදු නොවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබන බව. | විධිමත් අධීක්ෂණයක් හා අභ්‍යන්තර පාලනය ශක්තිමත්ව පවත්වා ගත යුතුය. සේවයට වාර්තා නොකර සිටීම පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | තලවාකැලේ හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොරොත්තු ලේඛනයේ දක්වා ඇති වැඩිහිටි, ආබාධිත හා වකුගඩු දීමනා ඉල්ලුම්කරුවන් 881 දෙනෙකුට දීමනා ලබා ගැනීමට පැමිණෙන ලෙස නිලධාරීන් විසින් නිසි පරිදි දැනුවත් කිරීම් සිදු නොකර නොසැලකිල්ලෙන් හා අනවධානයෙන් කටයුතු කර 2023 ජූලි හා අගෝස්තු මාසවලට අදාල රු.8,810.000 ක් දීමනා අදාල ප්‍රතිලාභීන්ට ගෙවා නොතිබුණි. | නිලධාරි හිඟය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බව. | සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ට දීමනා ගෙවීමට කටයුතු කළ යුතු අතර, අදාළ දීමනා නොගෙවූ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය සැසදීමේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 සඳහා අනුමත කාර්මික සහ තාක්ෂණ සහයක නිලධාරීන් සංඛ්‍යාව 24ක් වුවද, ඉන් තනතුරු 17 ක් පුරප්පාඩු වි පැවතුණු අතර අනුමත ග්‍රාම නිලධාරි සංඛ්‍යාව 491 ක් වුවද, පුරප්පාඩු 109ක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංවර්ධන සම්බන්ධීකාරක තනතුරු 02ක් අතිරික්තව පැවතුණි. | අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |